# අධ්‍යාපනඥයකු හා විශිෂ්ට දේශප්‍රේමියකු වූ එල්.එච්. මෙත්තානන්ද

## අධ්‍යාපනඥයකු හා මානව හිතවාදී දේශප්‍රේමියකු වූ බෞද්ධ පුනර්ජීවනයට මඟ පෑදු එල්.එච්. මෙත්තානන්දගේ 113 වැනි ජන්ම දිනය මාර්තු 19 වන දාට යෙදේ



ප්‍රවීණ පුවත්පත් කලාවේදියකු වූ ඩී.බී. ධනපාල, මෙත්තානන්ද මහතා ගැන ලියූ ලිපියක මෙසේ සඳහන් විය. "බෞද්ධ සම්මේලන දුසිම් භාගයකට වැඩි ගණනක ශක්තියටත්, එයට ම එක් වූ තරුණ බෞද්ධ සමිති සියයක ශක්තියටත් වැඩි ජවයක් මෙත්තානන්ද මහතා තුළ විය."

ලොකුසතු හේවා මෙත්තානන්ද මහතාගේ අංක එකේ ආදරය අධ්‍යාපනයට විය. එතුමාගේ ලියකියවිලි පරීක්ෂා කරත් ම එතුමා වැඩ කළ හැම පාසලක ම වැඩ කටයුතු සඳහා කොතරම් කාලයක් හා ශ්‍රමයක් වැය කළේ ද කියා පෙනී යයි.

1932-1936 එතුමා ආනන්ද විද්‍යාලයේ වැඩ බලන අධිපති වශයෙන් සිටි කාලයේ දී සහ 1945-1955 විද්‍යාලයාධිපති වශයෙන් සේවය කළ කාලයේ දී, ආනන්ද විද්‍යාලයත්, එහි අනාගතයත් සම්බන්ධයෙන් එතුමා කෙරේ වූ දර්ශනය අගය කළ යුතු ය. 1936-1945 වකවානුවේ දී මෙත්තානන්ද මහතා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ප්‍රධානාචාර්ය විය. එවකට ධර්මරාජය දුෂ්කරතා ගණනාවකට මුහුණ දෙමින් සිටියෙන් එකී ගැටලු නිරාකරණය කොට, විද්‍යාලයට නව පණක් ලබා දීමට මෙත්තානන්ද මහතා සමත්වනු ඇත යන විශ්වාසය එම පත් කිරීමට හේතු විය. එසේ ම ඔහු එය කළේ ය.

මෙත්තානන්ද මහතාගේ චරිතයේ විශේෂ ලක්ෂණය වන, උපායශීලී බව හා අන්‍යෝන්‍ය සම්බන්ධතා විෂයෙහි ඇති දක්ෂතා යොදා ගනිමින් ගුරු මණ්ඩල අතර එකමුතුකම ගොඩනඟා පාසල ප්‍රගති මාර්ගයට ගෙන ඒමට එතුමා සමත් විය. මෙත්තානන්ද මහතා බලංගොඩ ආනන්ද මෛත්‍රීය හිමි (එවකට ආනන්දයේ ගුරුවරයෙක් ව සිටි) මඩිහේ පඤ්ඤාසීහ මාහිමි හා හේන්පිටගෙදර ඥානසීහ හිමි යන ස්වාමීන් වහන්සේලා සමඟ සමීප සම්බන්ධයක් ගෙන ගියේ ය. මේ සියලු දෙනා මෙරට බෞද්ධ ජනතාව පුබුදුවාලීමටත්, නිදහස ලැබීමත් සමඟ බලයට පැමිණි ඩී.එස්. සේනානායක මහතා හා ඉනික්බිති බලයට පැමිණි නායකයන්ගේ කාලය තුළ බෞද්ධයන්ට සිදු වූ මදි පුංචිකම් පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීමේ පුරෝගාමී වූවෝ වෙති.

අනගාරික ධර්මපාලතුමා විසින් ආරම්භ කරන ලද බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය ඉදිරියට ගෙන ගියෝ අතර මෙත්තානන්ද, පී. ද එස්. කුලරත්න, ජී.පී. මලලසේකර යන දේශාමාමකයෝ වූහ. අධ්‍යාපනඥයකු වූ මෙත්තානන්ද මහතාගේ අදහස වූයේ, අවුරුදු 440 ක විදේශ ආධිපත්‍ය යටතේ මෙරට සංස්කෘතියේ වූ සෝදාපාලුවේ වෙනසක් ඇති කර, සිංහල බෞද්ධ සංස්කෘතික උරුමය පුනරුත්ථාපනය කොට, සමාජය තුළ එයට හිමි විය යුතු තැන ලබා දිය යුතු ය යන්න ය. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා එතුමා අප්‍රතිහත ධෛර්යයෙන් වැඩ කළේ ය.

එතුමා සිය කර්තව්‍යය කොට ගත්තේ, මේ රටේ සිංහල බෞද්ධයා සතු විය යුතු තැන ලබා දීම ය. මේ සඳහා බෞද්ධ ජාතික බලවේගය ආරම්භ කිරීමට පුරෝගාමී වූ එතුමා අමද්‍යප ව්‍යාපාරයේ ද මූලාරම්භකයෙක් විය.

1935 දී ගාල්ලේ පවත්වන ලද සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන මහ සභා වාරයේ දී මෙත්තානන්ද මහතා එහි සභාපති වශයෙන් තේරී පත් විය. නව සභාපති වශයෙන් සභාව ඇමතූ එතුමා, බෞද්ධ ප්‍රතිපත්ති පදනම් කොට ගෙන අධ්‍යාපනය මෙහෙය විය යුතු යැයි අවධාරණය කළ බව වාර්තා වෙයි. දුප්පත්කම හා නූගත්කම අපරාධවලට තුඩු දෙන ප්‍රධාන හේතුව බව කී එතුමා මේ උවදුරු සමාජයෙන් තුරන් කිරීමේ වැදගත්කම පෙන්වා දුන්නේ ය. මෙත්තානන්ද මහතා සිංහල බෞද්ධ ප්‍රශ්නය සම්බන්ධයෙන් දැරූ අචල ස්ථාවරය නිසා සමහරු එතුමා ආගම් උමතුවෙන් පෙළෙන්නකු යැයි කීහ.

1951 දී ආචාර්ය ජී.පී. මලලසේකර මහතාගේ නායකත්වය යටතේ බෞද්ධ සම්මේලන නියෝජිත පිරිසක් ඩී.එස්. සේනානායක මහතා හමු විය. එහි දී ඔවුහු රටේ සිදුවන බෞද්ධ විරෝධී ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කරන්නැයි ඉල්ලා සිටියේ ය. "නිදහස ලැබ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පත් වූ ආණ්ඩුවක් පැවැතිය ද, සිංහල බෞද්ධයාට ඔවුන් සතු තැන දීමට කිසිවක් කර නැත." යන්න නියෝජිත පිරිසේ ස්ථාවරය විය. බෞද්ධ විරෝධී බලවේග, බෞද්ධයාට බරපතළ හානි පමුණුවන බව පෙන්වා දුන් නියෝජිතයෝ ආණ්ඩුවේ විවිධ පාලන මට්ටම්වලින් බෞද්ධයන්ට කෙරෙන මදිපුංචිකම් හා තදබල වෙනස්කම් පැහැදිලි කළහ. මෙම හමුව කෙළවර, නියෝජිත පිරිස ඉදිරිපත් කළ කරුණු ගැන සොයා බලන්නට කමිටුවක් පත් කරනු පිණිස එයට ඇතුළත් කළ යුතු අයගේ නම් ලැයිස්තුවක් ඩී.එස්. සේනානායක මහතා ඉල්ලා සිටියේ ය. පසුව, එවැනි කමිටුවක් පත් කිරීමට එරෙහි ව තමාට නීති පරිපාලන අංශයෙන්, උපදෙස් ලැබී ඇති බවත්, ආගමික කටයුතු නිරීක්ෂණයට එවන් කොමිසමක් පත් කිරීම ලංකා ආණ්ඩු ව්‍යවස්ථා 29 (2) (C) සහ (D) උල්ලංඝනය කිරීමක් වනු ඇතැයි තමාට දන්වනු ලැබ ඇතැයි ඩී.එස්. සේනානායක මහතා දැන්වී ය.

ඩී.එස්. සේනානායක මහතාට උපදෙස් දුන් අය බෞද්ධ විරෝධී බලවේගයන්ගේ මග පෙන්වීම් හා නිරීක්ෂණය යටතේ ක්‍රියා කළ අය වීමත් ඔවුන් කරන බෞද්ධ විරෝධී වැඩ කටයුතු එළිදරව් වනවාට ඔවුන් අකැමැති වීමත් මෙයට හේතු කාරක වූ බව විශේෂයෙන් කිව යුතු නැත.

මේ තත්වය යටතේ බෞද්ධයන්ට කරන වෙනස්කම් ගැන සොයා බැලීමට තමන්ගේ ම වූ කමිටුවක් පත් කිරීමට සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය තීරණය කළේ ය. මෙයට මහජනතාවගේ හා සංඝයා වහන්සේලාගේ උපරිම සහයෝගය ලැබිණ. ඒ සියලු දෙනා, අද මෙන් ගමන් පහසු නොවූ එදා, මුළු රට පුරා යමින් එමින්, විවිධ තරාතිරම්වල පුද්ගලයන්, සමිති සමාගම් මුණ ගැසෙමින් රැස් කළ සියලු තොරතුරු අළලා සකස් කළ වාර්තාව 1956 පෙබරවාරි මස 4 වැනි දා ආනන්ද විදුහලෙහි සංවිධානය කරන ලද උත්සව සභාවක දී සංඝයා වහන්සේ වෙත පිරිනමනු ලැබිණි. මෙම වාර්තාවේ අධ්‍යාපනය පිළිබඳ පරිච්ඡේදය සකස් කරන ලද්දේ මෙත්තානන්ද මහතා විසිනි.

කෙසේ වුව ද, මේ සියල්ල හමුවේ ආණ්ඩුවේ සහයෝගය නැතිව ප්‍රතිඵල ලබා ගැනීම උගහට බව වටහා ගත් මෙත්තානන්ද මහතා තම පරමාර්ථය ඉටු කර ගැනීමට වෙනත් මාර්ග සෙවී ය.

ක්‍රියාකාරී දේශපාලනයට පිවිසීමට මෙත්තානන්ද මහතා තුළ කැමැත්තක් නොවී ය. එහෙත් ජාතික අර්බුදයක් පැන නැඟී හැම විට ම එතුමා ක්‍රියාකාරී විය. එතුමා සිය කාර්යභාරය ලෙස පවරා ගන්නේ සිංහල බෞද්ධයන් දැනුවත් කිරීම හා පිබිදවීම ය. එමගින් අවශ්‍ය හා අපේක්ෂිත විපර්යාස සිදු වනු ඇති බව එතුමාගේ අදහස විය.

1934 දී මෙත්තානන්ද මහතා මැලේරියා මර්දන ව්‍යාපාරය තුළ ක්‍රියාකාරී සේවයක් ඉටු කළේ ය.

1934-1935 කාලය තුළ රෝග හා ආහාර හිඟය යන හිසින් 1936 දී ආණ්ඩුව නිකුත් කළ වාර්තාවෙහි එවකට සිටි සහන කටයුතු පිළිබඳ කොමසාරිස්, එච්.ජ්. නිවුන්හැම් මෙසේ කියයි. (47 පිටුව) " ආනන්ද විද්‍යාලයාධිපති මෙත්තානන්ද මහතාගේ මග පෙන්වීම යටතේ බෞද්ධ සම්මේලනය මට උපරිම සහයෝගය දෙමින්, ද්‍රව්‍ය බෙදා හැරීමේ කටයුත්ත ඉටු කළේ ය. මාස තුනක් තුළ හැම සති අන්තයකම මෙත්තානන්ද මහතා කෑගල්ල දිස්ත්‍රික්කයේ අදාළ ප්‍රදේශවලට යමින් කටයුතු කළේ ය. ආණ්ඩුව දුන් ආහාර ද්‍රව්‍ය මදිපාඩු වූ ප්‍රදේශවල ද මෙත්තානන්ද මහතා සිය උදව්කාරයන් සංවිධාන කොට ද්‍රව්‍ය බෙදා දීමේ කටයුතු ඉතා හොඳින් ඉතා දක්ෂ ලෙස ඉෂ්ට කළේ ය.''

රට ජාතියේ සේවයට මෙත්තානන්ද මහතා ඉටු කළ කාර්යභාරය සඳහා කෙනකුට සුවිශේෂී කැපවීමක් අනිවාර්යයෙන් තිබිය යුතු ය.

**රමණී ඩී. වික්‍රමරත්න**

(පරිවර්තනය භද්‍රා ගුණතිලක)